## නිපුණතා මට්ටම 09.5 . ශ්‍රී ලංකා විදේශ වෙළෙඳාමේ ස්වභාවය හා විදේශ වෙළෙඳ ප්‍රතිපත්ති විමර්ශනය කරයි.

### අපනයන වෙළෙඳාම

කිසියම් රටක් ලෝකයේ සෙසු රටවලට භාණ්ඩ හා සේවා අලෙවි කිරීම අපනයන වෙළෙඳාම ලෙස හඳුන්වයි.

**නිදසුන් ඃ** ශ්‍රී ලංකාව ඇමෙරිකා එක්සත් ජනපදයට ඇගලුම් අලෙවි කිරීම.

### ආනයන වෙළෙඳාම

කිසියම් රටක් ලෝකයේ සෙසු රටවලින් භාණ්ඩ හා සේවා මිලදී ගැනීම ආනයන වෙළෙඳාම ලෙස හඳුන්වයි.

**නිදසුන් ඃ** ශ්‍රී ලංකාව එක්සත් අරාබි එමීර් රාජ්‍යයෙන් ඛනිජ තෙල් නිෂ්පාදන මිලට ගැනීම.

**ශ්‍රී ලංකාවේ අපනයන ව්‍යුහය**

| | 1977 | 2015 | 2018 | 2019 |
|---|---|---|---|---|
| කෘෂිකාර්මික අපනයන | 79 % | 23.5% | 21.7% | 20.6% |
| කාර්මික අපනයන | 14% | 76% | 77.9% | 78.9% |
| ඛනිජ ද්‍රව්‍ය අපනයන | - | 0.3% | 0.3% | 0.3% |
| වර්ග නොකළ අපනයන | 07% | 0.2% | 0.1% | 0.2% |

**ශ්‍රී ලංකාවේ ආනයන ව්‍යුහය**

| | 1977 | 2015 | 2018 | 2019 |
|---|---|---|---|---|
| පාරිභෝගික භාණ්ඩ | 42 % | 25% | 22.4% | 19.8% |
| අන්තර් භාණ්ඩ | 48% | 51% | 56.2% | 57% |
| ආයෝජන භාණ්ඩ | 12% | 24% | 21.1% | 23.1% |
| වෙනත් | 01% | - | 0.3% | 0.04% |

### ශ්‍රී ලංකාවේ විදේශ වෙළෙඳ ප්‍රතිපත්තිය

ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන විදේශ වෙළෙඳ ප්‍රතිපත්තිය ගෝලීය ආර්ථිකය හා ශ්‍රී ලංකාව අතර සබඳතාව වැඩි දියුණු කිරීමට යොමු වූ විදේශ වෙළෙඳ ප්‍රතිපත්තියකි. වර්තමාන විදේශ වෙළෙඳ ප්‍රතිපත්තියේ ලක්ෂණ කිහිපයක් පහතින් දැක්වේ.

► වෙළෙඳ ගිවිසුම් ඇතිකිරීම මගින් විදේශ වෙළෙඳපොළ වෙත ශක්තිමත් ප්‍රවේශයක් ඇති කිරීම.

► වෙළෙඳාම තීරණය වන නීති හා රෙගුලාසි වෙනස් කිරීමට ප්‍රයත්න දැරීම.

► උපාය මාර්ගික වෙළෙඳ ප්‍රවර්ධනය.

► ආනයන තාර්කිකරණය සඳහා ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම.

► නොබැඳි විදේශ වෙළෙඳ ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කරමින් අපනයන ප්‍රවර්ධනයට කටයුතු කිරීම.

► ආයෝජන ප්‍රවර්ධනය සඳහා උපකාරී වන ද්වි පාර්ශ්වික ගිවිසුම් වලට එළඹීම.

---

**අභ්‍යාසය**

(i) ශ්‍රී ලංකාවේ ප්‍රධාන කාර්මික අපනයන සහ ආහාර නොවන පාරිභෝගික ආනයන අයිතම දෙක බැගින් දක්වන්න ( ලකුණු 04 )

(ii) ශ්‍රී ලංකාව භාණ්ඩ අපනයනය කරන සහ ආනයනය කරන ප්‍රධාන රටවල් දෙක බැගින් සඳහන් කරන්න ( ලකුණු 04 )

(iii) නිදහසින් පසු කාල සීමාව සැලකිල්ලට ගත් විට ශ්‍රී ලංකාවේ අපනයන හා ආනයන ව්‍යුහයේ කැපී පෙනෙන ලක්ෂණ මොනවාද ? ( ලකුණු 04 )

(iv) විදේශ වෙළෙඳාම තුළ ශ්‍රී ලංකාව වර්තමාණයේ මුහුණ දෙන ගැටළු හා ඊට බලපා ඇති හේතු පැහැදිලි කරන්න ( ලකුණු 04 )

(v ) ඉහත ගැටළු වලින් මිදීමට ගත යුතු ක්‍රියාමාර්ග සාකච්ඡා කරන්න ( ලකුණු 04 )

රංජිත් ඥානසිරි

ර / ගන්කන්ද මධ්‍ය විද්‍යාලය පැල්මඩුල්ල